# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,139 - 2019 අගෝස්තු මස 30 වැනි සිකුරාදා - 2019.08.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2500 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2503 |

සැ. යු. - (i) මුදල් පනත් කෙටුම්පත 2019 අගෝස්තු මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 සැප්තැම්බර් මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 සැප්තැම්බර් මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය www. documents.gov.*lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2497 - B 81555— 5,403 (2019/08)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරිමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයින් සඳහා නීති සහ උපදෙස්

1976 අංක 19න් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ විධිවිධානයන්ට සහ වරින්වර පනවනු ලබන නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට සියලු විභාග අපේක්ෂකයින් බැඳී ඇත.

1976 අංක 19 සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 20 වගන්තිය මගින් විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත කොන්දේසි හා සීමා කිරීම් නියම කරනු ලැබේ.

සියලු විභාග අපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතු අතර මෙම නීති කිසිවක් උල්ලංඝනය කරන විභාග අපේක්ෂකයකුට විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි පහත දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකි ය.

(i) විමර්ශනයට භාජනය වූ මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම
(ii) විමර්ශනයට භාජනය වූ විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සකු කිරීම
(iii) මුළු ජීවිත කාලයටම විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සියලු විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(iv) නිශ්චිත කාලවකවානුවක් සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(v) අත්හිටවූ විභාග තහනමක් සහිතව ලිපියක් නිකුත් කිරීම
(vi) සහතික පත්‍රය යම්කිසි කාලසීමාවක් තුළ තහනම් කිරීම
(vii) ප්‍රසිද්ධ විභාග පනත යටතේ අපරාධ නඩුවක් පැවරීම සඳහා විභාග අපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ එම ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම
(viii) විභාග අපේක්ෂකයා රජයේ සේවකයකු වන අවස්ථාවකදී විභාග අපේක්ෂකයාගේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් අදාළ විභාග අපේක්ෂකයාගේ පත්වීම් බලධාරියා වෙත (විනය ක්‍රියා මාර්ග ගැනීම සඳහා) වාර්තා කිරීම

විභාගයට පෙර හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ මොනයම් අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

1. සියලුම විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී සහ විභාග පරිශ්‍රය තුළදී විභාග ශාලාධිපතිට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ද අනෙකුත් විභාග අපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස හැසිරිය යුතුය. එසේම, විභාග අපේක්ෂකයන් විභාග පරිශ්‍රයේ දේපළවලට හෝ විභාග කාර්ය මණ්ඩලයේ පෞද්ගලික දේපලවලට කිසිදු අන්දමකින් හෝ අලාභ හානි නොකළ යුතු ය.

2. විභාග අපේක්ෂකයින් විභාගය පවත්වාගෙන යන කාලසීමාව තුළදීත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතිගේ සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම ආරම්භ කර පැය භාගයක් ගත වූවාට පසු කිසිදු විභාග අපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කර ගනු නොලැබේ. විභාගය අවසන් වන තුරු ද කිසිම අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටව යාමට ඉඩ ලබා දෙනු නොලැබේ. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට නියමිත වේලාවට සහභාගී වීමට කටයුතු කළ යුතු ය.

4. සෑම විභාග අපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුය. තමන්ට නියම කරන ලද අසුන හැර වෙනත් තැනක අසුන් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදු වේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතා බහ කිරීම හෝ පණිවිඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් වේ.

6. විභාග අපේක්ෂකයකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ අපේක්ෂකයාගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම ලිවීම, උත්තර පත්‍රය හඳුනාගත හැකි වන අයුරින් යම් සලකුණක් හෝ සටහනක් යෙදීම, උත්තර පත්‍රවල අසභ්‍ය හෝ අනවශ්‍ය දේ ලිවීම, උත්තර පත්‍ර සමග මුදල් නෝට්ටු ඇමිණීම සපුරා තහනම් වේ. අන්‍ය විභාග අපේක්ෂකයකුගේ විභාග අංකය තම උත්තර පත්‍රයේ ලිවීම ද වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංක ලියා ඇති උත්තර පත්‍ර ද ප්‍රතික්ෂේප කිරීම සිදු කෙරෙනු ඇත.

7. තමන් වෙත විභාග ශාලාවේදී සපයන කඩදාසි (විභාගය පැවැත්වෙන දිනයට අදාළව නිරීක්ෂකගේ කෙටි අත්සන හා දිනය යොදා ඇති පිළිතුරු ලිවීමේ කඩදාසි) හැර ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙනත් තැනක හෝ කිසිවක් නොලිවිය යුතු ය. මෙම උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සලකනු ලැබේ.

8. විභාග අපේක්ෂකයින් වෙත සපයනු ලබන කඩදාසි හෝ පිළිතුරු ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම පැහැදිලිව කපා හැර උත්තර පත්‍රයට ඇමිණීම හෝ විභාගය අවසානයේ පිළිතුරු පත්‍ර සමග භාරදීම හෝ ලබා දෙන උපදෙස් පරිදි සිදු කළ යුතුය. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටතට ගෙනයාම තහනම් වේ. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක නැවත ලියවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතු ය.

9. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම් ය. මෙම සියලු ද්‍රව්‍යයන් විභාග කොමසාරිස් ජනරාල් සතුවන අතර මෙම නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන ලිපි ද්‍රව්‍ය හා එක් එක් විභාගයේදී ළඟ තබා ගැනීමට ලිඛිතව අවසරදී ඇති ද්‍රව්‍යයන් හැර වෙනත් සටහන් පොත්, සටහන් ඇතුළත් කොළ හෝ කොළ කැබලි යනාදිය විභාග ශාලාව තුළ විභාගයට පෙනී සිටින අවස්ථාවේදී තමා සන්තකයේ හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතු ය. එසේම විභාග ශාලාව තුළ දී ජංගම දුරකථන, විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) තමා සන්තකයේ හෝ සමීපයෙහි තබා ගැනීම සහ එම උපකරණ / උපාංග භාවිතා කර බාහිර පාර්ශ්වයන්ගේ උදව් ලබා ගැනීම හා විභාගය පැවැත්වෙන අතරතුර වෙනත් පාර්ශ්ව හා සමාජ මාධ්‍ය වෙත තොරතුරු යැවීම වංචනික ක්‍රියාවක් සේම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය.

11. විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග ඉහත 10 ඡේදයේ විස්තර කර ඇති කාර්යයන් සඳහා භාවිතා කර අසු වුවහොත් එම උපකරණ / උපාංග අදාළ විමර්ශන කටයුතු අවසන් වන තුරු විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ භාරයට ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. විභාග ශාලාවේ අසුන් ගැනීමෙන් පසු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී කිසිම විභාග අපේක්ෂකයකු ළඟ, විභාගය සඳහා ගෙන ඒමට අවසර ලබාදී නොමැති කිසිදු ද්‍රව්‍යයක් හෝ උපකරණයක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් ය. විභාග ශාලාධිපති හෝ කාර්ය මණ්ඩලය නියම කළහොත් සෑම අපේක්ෂකයකුම තම සන්තකයේ තිබෙන දෑ සහතික කිරීමට සහ පරීක්ෂා කිරීමකට යටත් වන අතර මෙම අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට උත්සහ දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. යම් අපේක්ෂකයකු වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ සංඥා මගින් හෝ වෙන කිසිවකින් හෝ කොපි කිරීම හෝ කොපි කිරීමට ප්‍රයත්න දැරීම හෝ වංචා සහගත ලෙස කටයුතු කිරීම හෝ වරදක් වන්නේ ය. වෙන අයදුම්කරුවකුට උදව් දීම ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ විභාග කාර්ය මණ්ඩලයෙන් හෝ උදව් ලබා ගැනීම ද වරදක් වන අතර උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසියට යටින් තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතු ය.

14. විභාගය ආරම්භ වී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් වැසිකිළි/කැසිකිළි යාමට අවශ්‍යතාවයක් උදෙසා විභාග අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටතට යන්නට වුවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර කාර්ය මණ්ඩලයේ නිලධාරියකුගේ සුපරීක්ෂාකාරිත්වය යටතේ අපේක්ෂකයාට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එලෙස පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු/ඇය සෝදිසියකට භාජනය විය යුතු ය.

15. විභාග ශාලාවේ පිළිතුරු ලිවීමට පටන් ගැනීමට පෙර හෝ පසුව නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් වන්නේය. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ ව්‍යාජ අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීම වංචනික ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

16.විභාග අපේක්ෂකයකු හෝ විභාග අපේක්ෂකයකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

17. විභාග අපේක්ෂකයන් පහත උපදෙස් පරිදි ක්‍රියා කළ යුතු ය. ඃ

(i) සෑම විභාග අපේක්ෂකයෙකුම තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කර ගැනීමත්, ඉල්ලුම් කරන ලද විෂයයන් හා ප්‍රවේශ පත්‍රයේ සඳහන් විෂයයන් අතර නොගැලපීමක් පවතින්නේ නම් විභාග දෙපාර්තමේන්තුව විමසා විභාගයට පෙර සංශෝධනය කර ගැනීමත් සිදු කළ යුතු ය.

(ii) විභාගය පටන් ගැනීමට පැය බාගයකට (1/2) පෙර විභාග ශාලාව වෙත පැමිණීම සුදුසු වන අතර විභාග ශාලාව නිශ්චිතව නොදන්නා විට විභාගය පටන් ගන්නා දිනට කලින් ඒ පිළිබඳ සොයා බලා නියම ස්ථානය නිශ්චිතව හඳුනා ගැනීම යෝග්‍ය වේ.

(iii) විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍රය ඉදිරිපත් කර තම අනන්‍යතාව තහවුරු කළයුතු ය.

(අ). අනන්‍යතාව ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛන විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරන අතර, යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ පිළිබඳ විභාග ශාලාධිපති දැනුවත් කර විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීම කටයුතු කළයුතු ය.

(ආ). සෑම අපේක්ෂකයකුම තම අනන්‍යතාව පැහැදිලිව පෙනෙන ලෙස සම්පූර්ණ මුහුණ හොඳින් හඳුනාගත හැකිවන අයුරින් විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ විභාග ශාලාවේ රැඳී සිටිය යුතු ය.

(iv) විභාග අපේක්ෂකයන් බ්ලූටූත් වැනි විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) භාවිතා නොකරන බව සහතික කර ගැනීම සඳහා විභාග ශාලාවේදී තම දෙකන විවෘතව පැහැදිලිව පෙනෙන ලෙස තබාගත යුතු ය.

(v) විභාග ශාලාවේදී ඔබට ලබා දෙනු ලබන කඩදාසි හැර වෙන මොන ම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුය. ඉතිරිවන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ මේසය මත තබා යා යුතු ය.

(vi) විභාග අපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, මකන, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතු ය.

(vii) තමන් භාවිතා කරන පිළිතුරු ලිවීමේ පොත සහ සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය පැහැදිලිව සඳහන් කළ යුතු ය. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද, පිරිසිදුව ද උත්තර ලිවිය යුතු ය. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු එම ප්‍රශ්නයේ ම අනෙක් කොටස පටන් ගැනීමට පෙර එක් රූලක්වත් හිස්ව තිබිය යුතුය. සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

(viii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුය. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක නිවැරදිව යෙදීමට කටයුතු කළ යුතු ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද, සෑහෙන පමණ විශාලව ද තිබිය යුතු ය.

(x) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් සඳහන් කර ඇති උපදෙස් හොඳින් කියවා බැලිය යුතුය. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුව පිළිතුරු ලබාදී නොමැති අවස්ථාවලදී ලකුණු ලබා දීම සිදු කරනු නොලැබේ.

(xi) එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද පොතට අමතරව ලියන කඩදාසි පිටු අංක පිළිවෙළ අනුව එකතුකර වම් පැත්තේ ඉහළ කෙළවරේ නොගැලවෙන සේ ගැටගැසීම / ඇමිණීම කළයුතුය. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර සියලුම පිළිතුරු ලියූ කොළ අමුණා තිබේද යන්න තහවුරු කරගත යුතුය. පිළිතුරු පත්‍ර භාරදුන් පසුව විභාග මධ්‍යස්ථානයෙන් බැහැරට ගෙන ගිය කිසිදු පිළිතුරු ලියූ කඩදාසියක් ඇගයීමට ලක් කරනු නොලැබේ.

(xii) ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්යය මණ්ඩලයේ නිලධාරියකුට භාරදිය යුතුය. උත්තර පත්‍ර එකතු කරන තුරු ඔබගේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම්විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකි ය.

(xiii) යම් කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට කථා කිරීමට අවශ්‍ය වූ විට අන් අයට බාධාවක් නොවන සේ දෙවරක් මේසයට තට්ටු කිරීමෙන් සංඥා කළ යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මාතලේ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 62 ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ.)

04. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා ඉල්ලුම්කරන්නන් විවාහක අය විය යුතු අතර විවාහ වී වසර 05කට නොඅඩු විය යුතු ය. වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

05. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2019 සැප්තැම්බර් මස 30 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2019 ජූලි මස 05 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතලේ | උකුවෙල | මාතලේ දකුණ කොට්ඨාසයේ උකුවෙල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ. |

08-1009

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම - ගාල්ල දිස්ත්‍රික්කය

අංක 2126 හා 2019.05.31 දිනැති *ගැසට්* පත්‍රයෙහි ම විසින් පළකරන ලද 05-821 දැන්වීමෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2019.09.30 වන දින දක්වා දීර්ඝ කරමි.

02. එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බවද කරුණාවෙන් සලකන්න.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | ගාල්ල කඩවත් සතර | ගාල්ල දිස්ත්‍රික් කොට්ඨාසයේ ගිංතොට ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |
| ගාල්ල | ගාල්ල කඩවත් සතර | ගාල්ල දිස්ත්‍රික් කොට්ඨාසයේ කුරුඳුවත්ත/ ගිංතොට ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |

08-1101

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ විවාහ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම - මාතර දිස්ත්‍රික්කය

අංක 2130 හා 2019.06.28 දිනැති *ගැසට්* පත්‍රයෙහි ම විසින් පළකරන ලද 06-776 දැන්වීමෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන විවාහ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2019.09.23 වන දින දක්වා දීර්ඝ කරමි.

02. එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බවද කරුණාවෙන් සලකන්න.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතර | වැලිපිටිය | උඩුකාව කොට්ඨාසයේ උප්පැන්න මරණ හා වැලිගම් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර. |
| මාතර | අකුරැස්ස | වැලිගම් කෝරළය (අකුරැස්ස) කොට්ඨාසයේ අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර |
| මාතර | හක්මන | කැබිලියපොල කොට්ඨාසයේ උප්පැන්න මරණ හා කන්දබඩ පත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර |

08-1100

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම - මාතර දිස්ත්‍රික්කය**

අංක 2130 හා 2019.06.28 දිනැති *ගැසට්* පත්‍රයෙහි ම විසින් පළකරන ලද 06-777 දැන්වීමෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2019.09.23 වන දින දක්වා දීර්ඝ කරමි.

02. එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බවද කරුණාවෙන් සලකන්න.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතර | වැලිපිටිය | වැලිගම් කෝරළය කොට්ඨාසයේ වටගෙදරමුල්ල ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර. |
| මාතර | මාතර | වැල්ලබඩ පත්තුව සහ කඩවත් සතර කඩේ වීදිය කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර |

08-1099

---

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ විවාහ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම - ගාල්ල දිස්ත්‍රික්කය**

අංක 2126 හා 2019.05.31 දිනැති *ගැසට්* පත්‍රයෙහි ම විසින් පළකරන ලද 05-820 දැන්වීමෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන විවාහ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2019.09.30 වන දින දක්වා දීර්ඝ කරමි.

02. එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බවද කරුණාවෙන් සලකන්න.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | නියාගම | පිටිගල කොට්ඨාසයේ උප්පැන්න මරණ හා බෙන්තර වලල්ලාවිට කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |

08-1098

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

(ISO 9001:2015 තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි)

කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත ලියාපදිංචි කිරීම, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2019**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුනයකු වන්න.

***පාසැල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ පාඨමාලාව***
***NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)***

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩ සටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුලු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

*පාඨමාලා කාලය : මාස 14 යි (පූර්ණ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 22,500.*

**මයික්‍රොසොෆ්ට් ඔෆීස් - Microsoft Office**

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර, පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

*කාලය : මාස 04 (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 13,500.*

**පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design**

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

*කාලය : මාස 05 (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි*

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 17,000/- NVQ සහතික පත් පාඨමාලාව රු. 22,500.

**පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting and Desktop Publishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර, මුද්‍රණ, ග්‍රැෆික්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස් වන අතර, ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

*කාලය : මාස 05 (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි* පාඨමාලා ගාස්තුව : රු. 13,500.

**වෙබ් අඩවි නිර්මාණය - Web Designing**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

*කාලය : මාස 04 (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 16,500.*

**මුද්‍රණ ක්ෂේත්‍රයට අදාල පිරිවැයකරණය සහ ඇස්තමේන්තුකරණය - Costing and Estimating for Printers**

මෙම පාඨමාලාව තුළින් මුද්‍රණ ක්ෂේත්‍රයට අදාල පිරිවැයකරණය හා ඇස්තමේන්තුකරණය (Job Costing and Estimating) පිළිබඳ පුළුල් අවබෝධයක් සහ දැනුමක් ලබාදේ. ග්‍රැෆික්ස් සහ මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුල්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉතා යෝග්‍ය වේ.

*කාලය : අවුරුදු 01 (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 19,000.*

**පොත් බැඳීම හා නිමාකරණය - Book Binding & Finishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක් හා න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයකි.

*කාලය : මාස 07 යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 20,000.*

**ග්‍රැෆික් ඩිසයින් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Graphic Design**

මෙම පාඨමාලාව මගින් මුද්‍රණ ග්‍රැෆික් නිර්මාණකරණය, කළමනාකරණය සහ මෘදුකාංග ඇතුළුව නිර්මාණ සංකල්ප සහ යෙදීම් පිළිබඳ උසස් මට්ටමේ ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාල මෘදුකාංග භාවිතයෙන් සාර්ථක නිර්මාණ බිහි කිරීමේ නිපුණතාවයන් වර්ධනයවන අයුරින් මෙහි විෂයය මාලාව සකස් කර ඇති අතර මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔබට පරිපූර්ණ ග්‍රැෆික් නිර්මාණකරුවකු විය හැක.

*කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 38,500.*

**මුද්‍රණ ඇසුරුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Print Packaging Technology**

මෙම පාඨමාලාව තුළින් ඇසුරුම්කරණය පිළිබඳ මුල සිට අග දක්වා විස්තරාත්මකව දැනුම සහ පුහුණුව ලබා දේ. දැනුම පුළුල්වන අයුරින් ඇසුරුම් ආයතනවලට පුහුණුකරුවන් රැගෙන ගොස් විශේෂ දේශන පැවැත්වීම ද මෙම පාඨමාලාව අන්තර්ගතය තුළ සකසා ඇත.

මෙම පාඨමාලාව ඇසුරුම්කරණ ආයතනවල නියැලි පුද්ගලයන්ට මෙන්ම මෙම ක්ෂේත්‍රයට ඇතුල්වීමට උනන්දුවන නවකයන්ට ද සුදුසු අයුරින් පුළුල් දැනුමක් ලැබෙන ආකාරයෙන් අන්තර්ගතය සකස් කර ඇත.

*කාලය : වසර 01 යි පාඨමාලා ගාස්තුව : රු. 40,000.*

පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
දුරකථන අංක : 011 2686162 , 011 2679791.
ෆැක්ස් : 011 2686162 ඊ-මේල් : sliopdir@sltnet.lk වෙබ් අඩවිය : www.sliop.edu.lk

*ශාඛා* :- ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ.
දුරකථන අංක : 066 2222172
071 0554298

08-1007

## සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

### අතුරු වෛද්‍ය සේවාවේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2019

සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවාවේ පහත සඳහන් පාඨමාලාවෙහි පුහුණුව සඳහා අභ්‍යාසලාභිනියන් බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා අයදුම් කළ හැක්කේ මෙම අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය (www.health.gov.lk) ඔස්සේ පමණි.

| *සේවාව* | *පුහුණු පාඨමාලාවේ නම* | *පුහුණු කාලසීමාව* | *පුහුණු පාඨමාලාව හැදෑරිය යුතු භාෂා මාධ්‍යය* | *පුහුණුවට බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව* |
|---|---|---|---|---|
| අතුරු වෛද්‍ය සේවාව | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී | ක්ෂේත්‍ර පුහුණුව මාස 06 ඇතුළුව වසර 01 1/2 | සිංහල, දෙමළ | 850 |

**අංක 01 වගුව**

2. *අධ්‍යාපන හා තනතුරට අදාළ වෙනත් විශේෂ සුදුසුකම් :-*

| *පුහුණු පාඨමාලාව* | *අ.පො.ස (සා. පෙළ) සුදුසුකම්* | *අ.පො.ස (උ. පෙළ) සුදුසුකම්* | *පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් විශේෂ සුදුසුකම්* |
|---|---|---|---|
| පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි | සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) කින් අ.පො.ස. (සා.පෙළ) සමත්වීම. | 2015, 2016 සහ 2017 යන වර්ෂවල දී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් තුනක් (3) එක්වරකදී සමත්වීම. | 1. අයදුම් කළ හැක්කේ ස්ත්‍රී පක්ෂයට පමණි.<br>2. උස අඩි 4 අඟල් 10ක් හෝ ඊට වැඩි විය යුතුය.<br>3. සියලුම අයදුම්කාරියන් අවිවාහක විය යුතු අතර පුහුණු කාල සීමාව තුල විවාහ නොවිය යුතුය. න්‍යායික පුහුණුව ලබාදී තාවකාලිකව සේවයේ යොදවන සිසුවියන්ද විධිමත් පුහුණුව සඳහා අනුයුක්ත කර පත්වීම් ලබා දෙන තෙක් විවාහයට ඇතුළත් නොවිය යුතුය. |

3. *පාඨමාලාවට අදාළ සුවිශේෂී කරුණු :*

3.1. අයදුම්කාරියන් අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුය. අදාළ සුදුසුකම් සපුරන 2015, 2016 සහ 2017 යන වර්ෂවල අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් තුනක් (3) එක්වරකදී සමතුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

3.2 අතුරු වෛද්‍ය සේවාවේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරට බඳවා ගැනීමේ පරිපාටියේ හා ඊට වරින්වර සිදුකරන ලද සංශෝධන ප්‍රකාරව සුදුසුකම් සපුරන අයදුම්කාරියන්ගෙන් බඳවා ගැනීම සිදු කරනු ලබන අතර, අයදුම්කාරියන්ගේ අ.පො.ස. (උ.පෙළ) Z අගය පදනම් කරගෙන පුහුණු පාඨමාලාවට බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

3.3 දිවයිනෙන් බඳවා ගැනීමට නියමිත මුළු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.4 ඉන්පසු එම එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් අයදුම්කර අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති මුළු අයදුම්කාරියන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.3 ***පොදු කරුණු :-***

3.3.1 ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.;

3.3.2 සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය ලබාදීම සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

3.3.3 තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

3.3.4 අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

3.3.5 මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

3.3.6 පුහුණුවෙන් පසු මධ්‍යම රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක් ලද හොත් ඔබ අවම වශයෙන් වසර 10 ක් සේවය කළ යුතු ය.

3.3.7 තමන් අයදුම්කරන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2019.09.27 වැනි දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතු ය. පදිංචිය සනාථ කිරීමට පහත ලේඛනවලින් එකක් ඉදිරිපත් කළ යුතු ය.

(i) 2019.09.27 වැනි දිනට පූර්වාසන්න වසර 03 ක් තුළ ඔබ එම දිස්ත්‍රික්කය තුළ අඛණ්ඩව පදිංචි වී සිටිය යුතු ය. ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ ග්‍රාම නිලධාරි සහතිකය.

*සටහන :-*

යම් අපේක්ෂිකාවකගේ පියා හෝ මව රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටීම හේතුවෙන් හෝ වෙනත් නොවැළැක්විය හැකි කරුණක් මත යම් අපේක්ෂිකාවකට පූර්වාසන්න වසර 03 තුළ පදිංචිය සනාථ කළ නොහැකි අවස්ථාවල දී පිළිගත හැකි හේතු ඉදිරිපත් කළහොත් ඒ පිළිබඳව අවසන් තීරණය සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් ගනු ලැබේ.

3.3.8 යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කළ පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා සුදුසුකම් සපුරන ලද අයදුම්කාරියන්ගෙන් සම්පූර්ණ කළ නොහැකි අවස්ථාවල දී එම පුරප්පාඩු සංඛ්‍යාව දිවයිනේ සියලු දිස්ත්‍රික්ක අතර එම දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදාහරිනු ලැබේ.

4. ***වෙනත් කරුණු :***

4.1 මෙම පාඨමාලාව පූර්ණකාලීන පාඨමාලාවක් වේ. එබැවින්, සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ වෙනත් කුමන හෝ පූර්ණකාලීන පාඨමාලාවන් හදාරන සිසුවියන් මේ සඳහා අයදුම් නොකළ යුතු ය. යමෙකු එසේ අයදුම් කර, පසු අවස්ථාවක දී හෝ එය අනාවරණය වුවහොත් පාඨමාලාවෙන්/තනතුරෙන් ඉවත් කර ඒ වනතෙක් රජය විසින් ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් අය කර ගනු ලැබේ. විශ්වවිද්‍යාලයක පූර්ණකාලීන පාඨමාලාවක් හදාරන අයකු එසේ අයදුම් කිරීමට අදහස් කරන්නේ නම්, ඒ සඳහා පහත දැක්වෙන ආකාරයට ක්‍රියාකළ යුතු ය. සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨමාලාවල ලියාපදිංචි වී සිටින අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.2 කිසියම් දිනක ඔබ කුමන හෝ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචිව සිටියේ නම් හෝ සිටින්නේ නම්, මෙම පාඨමාලාවට ලියාපදිංචි කරනු ලබන දිනය වන විට ඔබ එම ලියාපදිංචිය අවලංගු කරගෙන තිබිය යුතු ය. ඔබ විශ්වවිද්‍යාලයක ලියාපදිංචිව සිට දේශන සඳහා සහභාගි නොවූ හෝ සහභාගි නොවන අයෙක් වුව ද ඔබ විශ්වවිද්‍යාල සිසුවියකු ලෙස සලකනු ලබන බැවින්, එවැනි අයදුම්කාරියන් ද තම ලියාපදිංචිය අවලංගු කරගත යුතු ය. අවශ්‍ය අවස්ථාවලදී එය සනාථ කිරීම පිණිස ප්‍රමාණවත් ලිඛිත සාධක ඔබ සතුව තිබිය යුතු ය.

4.3 ඔබ යම් විශ්වවිද්‍යාලයක උපාධියක් සම්පූර්ණ කර සිටින අයෙක් නම්, එම උපාධිය බලපැවැත්වෙන දිනය (EFFECTIVE DATE) පාඨමාලාවට බඳවා ගන්නා දිනට පෙර දිනයක් විය යුතු ය.

4.4 2019.09.27 වැනි දින වන විට ඔබ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පැවැත්වෙන පාඨමාලාවක හෝ ලියාපදිංචි වී නොසිටි අයෙක් වුව ද, යම් හෙයකින් ඉහත පුහුණු පාඨමාලාවන් සඳහා ලියාපදිංචි කරන දින වන විට ලියාපදිංචි වී සිටියේ නම් ඇය ද උක්ත පුහුණු පාඨමාලාවන් සඳහා ලියාපදිංචිය ලබා ගැනීමට පෙර එම පාඨමාලාවේ ලියාපදිංචිය අවලංගු කර ගත යුතු ය.

4.5 සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨමාලාවල ලියාපදිංචි වී සිටින අයදුම්කාරියන් වේ නම් ඔවුන් පුහුණුවට තේරී පත්වුවහොත් ඒ වනවිට ලබමින් සිටි පුහුණුවට අදාළව අත්සන් කර තිබෙන ගිවිසුම්වලට අනුව ගිවිසුම්ගත මුදල හා ඒ වන විට ලබා ඇති සියලු දීමනාවන් ගෙවා අදළ පුහුණුවෙන් ඉවත් වුවහොත් පමණක් ඉහත පුහුණුව සඳහා ලියාපදිංචි කරනු ලැබේ.

4.6 ඉහත කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද අනිවාර්යයෙන්ම ඔබ මෙම පාඨමාලාව සඳහා ඇතුළත් කර ගන්නේය යන්න මෙම *ගැසට් නිවේදනයේ* කුමන හෝ වගන්තියක් මගින් අදහස් <u>නොකෙරෙන</u> බව ඔබ තරයේ සිහි තබා ගත යුතු ය. එමෙන් ම ඉහත කොන්දේසි සම්පූර්ණ කර තිබුණ ද, ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් කිසිදු අයුරකින් මෙම පාඨමාලාවන් සඳහා සුදුසුකම් නොලබන බව ඔබ දැනගත යුතු ය.

4.7 අධ්‍යාපන සුදුසකම් හා අනෙකුත් සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2019.09.27 වැනි දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

5. *අයදුම් කළයුතු ක්‍රමය* ඃ

5.1 ඉහත පුහුණු පාඨමාලාව සඳහා අයදුම් කළ යුත්තේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය (www.health.gov.lk) මගිනි. ඒ සඳහා මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ අදාළ කොටසේ ඇති අයදුම්පත සම්පූර්ණ කර එවිය යුතු ය. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් එකී විද්‍යුත් අයදුම්පතෙහි දක්වා ඇත.

5.2 අයදුම්කරුවන් රු.300 ක මුදලක් ලංකා බැංකුව, තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, විභාග ගාස්තු රැස්කිරීම ගිණුමට ගෙවිය යුතු ය. ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවීම් කළ හැකි ය. මෙම ගාස්තු කවර හේතුවක් නිසා හෝ ආපසු නොගෙවන අතර, වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ.

5.3 මෙලෙස ඔබ විසින් සාර්ථකව උඩගත කරන ලද (UPLOAD) අයදුම්පතෙහි පිටපත් තැපැල් මගින් මෙම අමාත්‍යාංශය වෙත එවීමට අවශ්‍ය නොවේ. එහෙත්, අයදුම්පත උඩගත කිරීමෙන් අනතුරුව ලැබෙන අංක 5කින් යුත් කේතය, මුද්‍රිත පිටපත් පසුව ලබා ගැනීමේ පහසුව සඳහා සුරක්ෂිතව තබාගන්න. එසේම අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් (Print out) ලබාගෙන එහි අදාළ ස්ථානයේ ඔබගේ අත්සන යොද අත්සන සහතික කරවාගෙන සම්මුඛ පරීක්ෂණයට කැඳවුවහොත් රැගෙන ආයුතුය. (6 වැනි කොටස බලන්න)

***සටහන*** ඃ- අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී ඔබට යම් ගැටළුවක් ඇති වුව හොත් ඒ සම්බන්ධයෙන් සතියේ වැඩකරන දින පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 අතර කාලය තුළ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ ඒකකයේ දුරකතන අංක 0112 693 955 ඇමතීමෙන් මේ සම්බන්ධයෙන් උපදෙස් ලබාගත හැකි ය.

6. *අයදුම්කාරියගේ අත්සන සහතික කිරීම* ඃ-

6.1 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියකු/අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියකු/ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරියකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්වයකාරවරයකු/නීතිඥවරයකු හෝ වර්ෂයකට රු. 5,12,148 කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියකු විසින් අයදුම්කාරියගේ අත්සන සහතික කල යුතුය.

6.2 රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය. එමෙන්ම, මෙය බාහිර බඳවා ගැනීමක් බව සිහි තබාගත යුතුය.

6.3 මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූලනොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. *සම්මුඛ පරීක්ෂණයකට ඔබ කැඳවුම් ලැබුවහොත් ඔබ විසින් ඉදිරිපත් කළ යුතු තොරතුරු* ඃ-

7.1 ඔබ විසින් සාර්ථකව උඩගතකර ඇති විද්‍යුත් අයදුම්පත අනුව අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කාරියන් අතුරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සේවා ව්‍යවස්ථාවේ හා මෙම *ගැසට්* නිවේදනයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුර වෙනුවෙන් දක්වා ඇති සුදුසුකම් හා කායික යෝග්‍යතාව පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලිපිලේඛනයන්හි ***මුල් පිටපත්*** ඉදිරිපත් කළ යුතු ය.

7.2 විද්‍යුත් මාධ්‍යයෙන් උඩගත කරන ලද (UPLOAD) අයදුම්පතෙහි මුද්‍රිත පිටපත (ඔබගේ අත්සන සහතික කරන ලද).

7.3 උප්පැන්න සහතිකය.

7.4 අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දක්වෙන සහතිකය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද).

7.5 අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද).

7.6 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියැදුරු බලපත්‍රය.

7.7 බැංකුවට මුදල් ගෙවූ ලදුපත.

7.8 ඉහත දක්වෙන පරිදි පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය.

7.9 අවිවාහක බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවකු ඉදිරියේ රු. 50 ක මුද්දරයක් මත අත්සන් කරන ලද විධිමත් දිවුරුම් ප්‍රකාශය

7.10 විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ /සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ පාඨමාලාවක ලියාපදිංචි වී හෝ සහභාගි නොවන බවට ඔබගේ බහුමාන සහතිකය.

*සටහන* :-

(*අ*) තව ද, ඉහතින් සඳහන් (7.3) සිට (7.7) දක්වා ලේඛනයන්හි මුල් පිටපත්වලට අමතරව සත්‍ය බවට තමා විසින්ම සහතික කරන ලද ඡායා පිටපත්, සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීමේදී රැගෙන ආ යුතු ය.

(*ආ*) පුහුණු පාසල්වල පවතින ඉඩ පහසුකම් හා සේවා අවශ්‍යතාව අනුව පුහුණුවට බඳවාගත යුතු සංඛ්‍යාව හා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව, සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

(*ඇ*) සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලු දෙනාම පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි අඩංගු වගන්ති කිසිවකින් අදහස් නොවන අතර එසේ තේරුම් ගත යුතු ද නොවේ.

(*ඈ*) සම්මුඛ පරීක්ෂණයෙන් පසු තෝරාගත් අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු http:// www.health.gov.lk වෙබ්අඩවියේ පළකරනු ලබන අතර කිසිවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.

8. *පුහුණු කිරීමේ පරිපාටිය* :-

8.1 සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද අයදුම්කාරියන් අතුරින් තෝරා ගත් අයදුම්කාරියන් අදාළ පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා ඒ ඒ පුහුණු පාසල්වලට ඇතුළත් කරනු ලැබේ. පුහුණු පාඨමාලාව ක්ෂේත්‍ර පුහුණුව මාස 06 ඇතුළුව වසර 01 1/2 කාලයක් සහ සිංහල/දෙමළ මාධ්‍යයෙන් හැදෑරිය යුතුය.

8.2 පුහුණු පාසල්වලට ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසල්වල බලපැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

8.3 පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත්වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ විභාග නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත්වන හෝ පුහුණුවට බඳවා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබෙන අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් අසත්‍ය බවට හෙළි වුවහොත් හෝ අභ්‍යාසලාභීන්ගේ පුහුණුව, ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකි ය.

8.4 පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ දී අභ්‍යාසලාභීන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන V හි විධිවිධාන වලට අනුව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

8.5 පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේදී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම ලදහොත් අවම වශයෙන් වසර දහයක (10) කාල පරිච්ඡේදයක් රාජ්‍ය සේවය යටතේ/පළාත් රාජ්‍ය සේවය යටතේ අදාළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු ය. ඉහත 8.3 කරුණු ප්‍රකාරව, පුහුණු කාලසීමාව තුළ දී පුහුණුවෙන් ඉවත් වුවහොත්, පුහුණුව හැර ගියහොත්, පුහුණුවෙන් ඉවත් කිරීමට සිදු වුවහොත් හෝ පත්වීම ලැබ වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදයක් ඉහත පරිදි අදාළ, තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණු කාලය තුළ දී ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ගිවිසුම්ගත මුදල ඇය විසින් සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත්, එම මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාර නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

8.6 පවුල් සෞඛ්‍ය සේවා පුහුණුවට අයදුම්කරන අයදුම්කාරියන් අයදුම්පත් එවන දිනය වන විට අවිවාහක විය යුතු අතර, පුහුණුව ලබන කාලය තුළ දී ද අවිවාහකව සිටීම අනිවාර්යය වේ.

9. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන්* :-

9.1 පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී, එහෙත්, පුහුණුව අවසන් කරන දිනය වන විට පවත්නා වූ පුරප්පාඩු මත සකස් කරන ප්‍රමුඛතා පුරප්පාඩු ලේඛනය සඳහා ජ්‍යෙෂ්ඨ නිළධාරීන් වෙත ස්ථාන මාරු ලබා දීමෙන් අනතුරුව ඉතිරිවන පුරප්පාඩු සඳහා පුහුණුව සාර්ථකව නිමකර අවසන් පරීක්ෂණය සමත්වන අභ්‍යාසලාභීන්ගේ පුහුණු පාඨමාලාවේ අවසන් පරීක්ෂණ කුසලතාවය සැළකිල්ලට ගෙන අදාළ තනතුරේ III වන පංතියේ තනතුරකට පත් කිරීම සඳහා සළකා බලනු ලැබේ. එමෙන්ම තෝරා ගනු ලබන අයදුම්කාරියන් පවතින පුරප්පාඩු අනුව ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා පත්කිරීමට යටත් වේ.

9.2 පුහුණු කාලය අවසානයේ දී ස්ථිර පත්වීම් ප්‍රදානය කළහොත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

9.3 අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේ දී ඉතා සැළකිළිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යටකී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/ තනතුරෙන් පහකරන අතර, ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඇයගේ නම ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තවද, පුහුණු කාලය තුළ දී ඇයට ගෙවන ලද දීමනාව රජය විසින් දරන ලද වියහියදම් හා ගිවිසුම්ගත අදාළ මුදල ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

9.4 තෝරාගත් අයදුම්කාරියන් අදාළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

9.5 ඉහත පරිදි බඳවා ගන්නා ලද සියළුම දෙනා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ සේවය සම්බන්ධව පනවන ලද රීති, රෙගුලාසි හා නියෝගවලට, සේවා ව්‍යවස්ථාවල විධිවිධානයන්ට, රජයේ මුදල් රෙගුලාසිවලට, රජයේ චක්‍රලේඛ හා උපදෙස්වලට හා ඒවාට අදාළව වරින්වර පනවනු ලබන නියමවලට හා සංශෝධනවලට ද යටත් වනු ඇත.

9.6 පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කාරියන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබාදෙන්නේ නම්, ඒ සඳහා තක්සේරු නිවාස කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අය කරනු ලැබේ.

9.7 මෙම පුහුණු කාලසීමාව තුළ දී වෘත්තීය සමිති කටයුතුවල යෙදීම හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත. එසේම, පුහුණුවෙන් පසුව ඔබ අදාළ තනතුරේ පත්වීම් ලදහොත්, <u>අනුමැතිය ලබා දී ඇති තනතුරුවල හැර අනෙක් තනතුරු දරන්නන්ට පෞද්ගලික සේවයේ යෙදීමට කිසිදු අයිතිවාසිකමක් නොමැත. එවැන්නක් සිදුකර අනාවරණය වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.</u>

9.8 පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්ත්වයක් උදාවුවහොත්, ඒ පිළිබඳ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

වසන්තා පෙරේරා,
ලේකම්,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.

2019 අගෝස්තු මස 05 වැනි දින,
"සුවසිරිපාය"
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

08-808

## සංශෝධනයයි

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත/විවෘත තරග විභාගය - 2017/2018

අංක 2135 - 2019.08.02 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* I කොටස ඃ ( II අ) ඡේදය යටතේ පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත/විවෘත තරග විභාගය 2017/2018 යටතේ පළ කරන ලද 08-208 දැන්වීමේ 1 වගන්තිය හා 5 (අ) සහ (ආ) වගන්ති පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

1. විභාග දිනය ඃ

විභාග කොමසාරිස් ජනරාල් විසින් 2019 නොවැම්බර් මස කොළඹ දී පමණක් විභාගය පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

ඒ අනුව අයදුම්පත්‍රයේ ඉල්ලුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය කොළඹ පමණක් වේ. දැනටමත් යාපනය නගරය ඉල්ලුම් කර ඇති අපේක්ෂකයින් සඳහා කොළඹ නගරය තුල විභාගය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

5. (*අ*) විවෘත පදනම යටතේ පත්වන නිලධාරීන් සඳහා මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා මුදල් ගෙවිය යුතු ය.

සීමිත පදනම යටතේ පත්වන නිලධාරීන් සඳහා මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(*ආ*) විවෘත පදනම මත බඳවා ගන්නා නිලධාරීන් වර්ෂ 03 ක පරිවාස කාලයකට ද සීමිත පදනම මත බඳවා ගන්නා නිලධාරීන් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට ද යටත් විය යුතුවේ. තවද, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා වූ 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පත්වීම් දින සිට වසර 3 ක් ඇතුළත සමත්විය යුතු ය.

*සැ.යු.-*

මෙම සංශෝධනය හේතුවෙන් සුදුසුකම් සළකා බැලීමේ දිනයෙහි (2019.08.02) සහ අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනයෙහි (2019.09.02) කිසිඳු වෙනසක් සිදු නොවන අතර, දැනටමත් අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ.ජේ.රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.

2019 අගෝස්තු මස 22 වැනි දින,
කොළඹ දී ය.

08-1112

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.